සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) "මෙම දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මඳකුත් ලෝකෝපකාරයෙන් තොරව මුහුදට නොයේවා" යැයි ප්‍රකාශ කලේ,

1. පණ්ඩුකාභය රජතුමා ය.  2. ධාතුසේන රජතුමා ය.
3. මහා පැරකුම් රජතුමා ය.  4. පළමු උපතිස්ස රජතුමා ය.

02) අතීතයේ දී ශ්‍රී ලංකාවේ බෙලෙක් භාණ්ඩ නිශ්පාදන කර්මාන්තයේ යෙදුන ශිල්පීන් හඳුන්වා ඇත්තේ කෙසේ ද?

1. කබර  2. තුලධර  3. තොපෂ  4. තඹර

03) පහත සඳහන් දාගැබ් අතරින් මහසෙන් රජු විසින් ඉදිකරවන ලද්දේ,

1. මිරිසවැටිය යි.  2. අභයගිරිය යි.
3. ථූපාරාමය යි.  4. ජේතවනාරාමය යි.

04) ඉන්දියාවේ පොන්ඩිචේරි ප්‍රදේශයේ වෙළෙඳ ගබඩාවක් පිහිටුවා ගනු ලැබුවේ කවුරුන් විසින් ද?

1. ඉංග්‍රීසීන්  2. ප්‍රංශ ජාතිකයන්  3. ස්පාඤ්ඤවරුන්  4. අරාබි ජාතිකයන්

05) පෘතුගීසීන් ශ්‍රී ලංකාව හඳුන්වනු ලැබුවේ,

1. සෙයිලන් නමිනි.  2. තම්බපණ්ණි නමිනි.
3. සෙරන්ඩිබ් නමිනි.  4. පාරසමුද්‍ර නමිනි.

- අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06) භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා ආරම්භයේ දී ස්වාභාවික ලෙන් භාවිතයට ගැණුනි. ( )

07) රුවන්වැලි මහ සෑ මළුවෙන් ධාතුසේන රජුගේ යැයි සැලකෙන රාජකීය ප්‍රතිමාවක් හමු වී ඇත. ( )

08) උඩරට රාජ්‍ය සමයේ විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතුණි. ( )

09) දේශ ගවේෂණ ආරම්භ වීමට පෙර කාලයේ දී ලෝක වෙළෙඳාමෙන් වැඩි කොටස මධ්‍යධරණී මුහුද හා ඒ අවට පෙදෙස්වලට සීමා වී තිබිණ. ( )

10) ක්‍රිස්ටෝපර් කොලොම්බස් බහමාස් දූපත් සමූහයේ සුමාත්‍රා දූපතට ගොඩබැස්සේය. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

11) දේවානම්පියතිස්ස රජතුමා විසින් .................වැව තනවන ලදැයි සැලකේ.
( අභය / තිසා / නුවර)

12) ලංකාවේ මුල්වරට උයනක් තනවන ලද්දේ .............................රජතුමන් විසිනි.
( මුටසීව / පණ්ඩුකාභය / වසභ )

13) ආරක්ෂාව සඳහා ................................. විහාරයේ කුරහන් ගලක් තුළ සඟවා තිබූ දළදා වහන්සේ පළමුවැනි විමලධර්මසූරිය රජතුමා විසින් උඩරටට වැඩම කරවී ය.
( කුරුවිට / දෙල්ගමුව / අස්ගිරිය )

14) ශ්‍රී විජය රාජසිංහ රජුට සිංහාසන උරුමකරුවෙකු නොසිටි බැවින් ඔහුගේ මරණයෙන් පසු අගබිසවගේ සොහොයුරෙකු .......................................නමින් උඩරට රජකමට පත් විය.
( රාජාධිරාජසිංහ / ශ්‍රී වික්‍රමරාජසිංහ / කීර්ති ශ්‍රී රාජසිංහ )

15) පුනරුද සමයේ ගොඩනැගිලි ඉදි කිරීමෙහි දී පැරණි ................................ ගෘහනිර්මාණ ශිල්පයේ යම් යම් ලක්ෂණ අනුකරණය කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි.
( රෝම / ඉංග්‍රීසි /ග්‍රීක )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර කුමක්දැයි ලියා දක්වන්න.**

16) කලක් වල් බිහි වී තිබූ සීගිරි ජල උද්‍යානය සෙනරත් පරණවිතාන සහ ........................................ යන පුරාවිද්‍යාඥයන් විසින් යළි පාදා ගන්නා ලදි.

17) අතීත ශ්‍රී ලංකාවේ උළු නිෂ්පාදනයේ යෙදුණු පිරිස ........................................ ලෙස හඳුන්වා තිබේ.

18) පොලොන්නරුවේ තිවංක පිළිමගෙය ...................................... සම්ප්‍රදායට අයත් අගනා විහාර නිර්මාණක් වේ.

19) වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සියමයට දූතයන් යවා ...................................... හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා මෙරටට වැඩමවා උපසම්පදා උත්සවයක් පැවැත් විය.


20) බ්‍රිතාන්‍ය අත්අඩංගුවට පත් වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවේ ............................ රැගෙන ගොස් එහි සිරගත කරන ලදි.

(ලකුණු 20 x 2 = 40)

## II - කොටස


- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01)




(අ) i. සේද මාවත ඔස්සේ ගොඩබිමෙන් රැගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය යුරෝපීය වෙළෙඳුන්ට අළෙවි කළ නගරය A අක්ෂරයෙන් දැක්වේ. එම නගරය හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 2)

ii. ආසියාවට පැමිණි වස්කෝදගාමා ඉන්දියාවට ගොඩබසින ලද කැලිකට් වරාය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 2)




(ආ) i. මහසෙන් රජතුමා විසින් ඉදිකරන ලද ප්‍රසිද්ධ වැවක් C අක්ෂරයෙන් දැක්වේ. එම වැව හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 2)

ii. යාබද ලංකා සිතියමේ, ශ්‍රී ලංකාවේ අවසාන රාජධානිය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? (ලකුණු 2)

(ඇ) i. A ඡායාරූපයෙන් දැක්වෙන රාජධානිය හඳුනාගෙන නම් කරන්න.


ii. මෙම රාජධානියට ආරක්ෂාව ලබාදෙන ගංගාවක් නම් කරන්න.

iii. මෙම රාජධානියට පිවිසිය හැකි දුර්ග මාර්ගයක් නම් කරන්න.

iv. මෙම රාජධානියේ මුල්ම රජතුමා කවුරුන් ද?

(ලකුණු 4)

A -



(ඈ) i. B ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.


ii. ඔහු උපන් රට කුමක් ද?

iii. ඔහු මරණයට පත් වූ දූපත කුමක් ද?

iv. ඔහුගේ මුහුදු ගමන නිසා ලෝකය පිළිබඳ එතෙක් පළ වෙමින් තිබූ මතයක් තහවුරු විය. එම මතය කුමක් ද?

(ලකුණු 4)

B -



02)

i. ධාතුසේන රජතුමා විසින් සාදවන ලද වැව් තුනක් නම් කරන්න (ලකුණු 3)

ii. පහත සඳහන් පොකුණු ඒවා පිහිටි රාජධානිය අනුව වර්ග කර වගුව සම්පූර්ණ කරන්න

( නෙළුම් පොකුණ / ඇත්පොකුණ / කුට්ටම් පොකුණ / කුමාර පොකුණ )

| අනුරාධපුර යුගය | පොලොන්නරු යුගය |
|---|---|
| A............................... | C....................................... |
| B............................... | D....................................... |

(ලකුණු 4)

iii. පහතින් දාගැබ හා සම්බන්ධ ඉදිකිරීම් දෙකක පින්තූර දෙකක් දක්වා ඇත. එම පින්තූර ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 4)

| පින්තූරය | ඉදිකිරීම හඳුන්වන නම | පිහිටි ප්‍රදේශය |
|---|---|---|
|  | A .......................... | B .......................... |
|  | C .......................... | D .......................... |

03)

i. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ බලය පතුරවාගෙන සිටි යුරෝපා ජාතීන් තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. පහතින් දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු A,B,C,D අනුපිළිවෙළින් ලියන්න.

A. බෞතීස්ම ලැබූ පසු කුසුමාසන දේවිය හැඳින් වූ නම කුමක් ද?

B. උඩරට බලයට පත් පළමු නායක්කර් වංශික රජතුමා කවුරුන් ද?

C. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා උඩරට රජවීමට පෙර හැඳින් වූ නම කුමක් ද?

D. ගම්පොළ රාජධානි සමයේ ඉදිකරන ලද ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ දේවාලය නම්කරන්න. (ලකුණු 4)

iii. උඩරට රජවරුන් හා පෘතුගීසීන් අතර ඇතිවූ සටන් පිළිබඳව වරහන් තුළ ඇති තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 4)


( සෙනරත් රජතුමා / අසවේදු / පළමුවන විමලධර්මසූරිය / කොන්ස්තන්තීනු ද සා / දියෝගු ද මේලෝ)


| සටන | උඩරට පාලකයා | පෘතුගීසී සෙනෙවියා |
|---|---|---|
| බලන | A................................ | දොන් ජෙරනිමෝ ද අසවේදු |
| රන්දෙනිවෙල | B................................ | C................................ |
| ගන්නෝරුව | දෙවන රාජසිංහ රජතුමා | D................................ |


04)

i. වෙළෙඳාම නිසා දියුණුවට පත් ඉතාලියේ පිහිටි වෙළෙඳ නගර තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. පුනරුද සමයේ බිහි වූ නිර්මාණ කිහිපයක් පහතින් දැක්වේ. එම නිර්මාණයට යටින් එහි නිර්මාපකයාගේ නම ලියන්න.









A ………………… B …………………… C ………………… D …………………

(ලකුණු 4)

iii. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. තාරකා විද්‍යාවේ පියා ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?
2. පුනරුද සමයේ පල්ලියේ බලයට එරෙහිව නැගී සිටි කණ්ඩායම හැඳින් වූ නම කුමක් ද?
3. මධ්‍යතන යුගය අවසානයේ ප්‍රංශයේ බිහිවූ විශ්ව විද්‍යාලයක් නම් කරන්න.
4. කලාත්මක කටයුතු සඳහා අනුග්‍රහය දැක්වූ මෙඩිසි පවුල ජීවත් වූ නගරය නම් කරන්න. (ලකුණු 4)

05)

i. පෘතුගීසීන් මෙරටට පැමිණෙන අවධියේ ලංකාවේ තිබූ පහත රාජධානි තුනෙහි පාලකයන් නම් කරන්න.

A. කෝට්ටේ

B. යාපනය

C. මහනුවර (ලකුණු 3)

ii. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පෘතුගීසීන් ලංකාවට පැමිණීමට පෙර මෙහි විදේශ වෙළෙඳාම් කටයුතුවල තනි අයිතිය ලබා සිටි විදේශිකයන් පිරිස කවුරුන් ද?
2. ක්‍රි.ව. 1505 දී පෙරදිග පෘතුගීසී ප්‍රතිරාජයා ලෙස පත්වූයේ කවුරුන් ද?
3. කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදී යාමට බලපෑ සිදුවීම කුමක් ද?
4. හත්වන බුවනෙකබාහු රජුගේ දියණිය කවුරුන් ද? (ලකුණු 4)

iii. සීතාවක රාජධානියේ උන්නතියට තුඩු දුන් හේතු හතරක් නම් කරන්න. (ලකුණු 4)

06)

i. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. යාපන රාජ්‍ය යටත්කරගත් පෘතුගීසී හමුදා කණ්ඩායමේ ප්‍රධානියා කවුරුන් ද?

B. කෝට්ටේ රාජධානියේ අවසාන පාලකයා නම් කරන්න.

C. ආසියාවේ පෘතුගීසීන්ට අයත් ප්‍රදේශ පාලනය සඳහා පිහිටුවා තිබූ පාලන මධ්‍යස්ථානය කුමක් ද?

(ලකුණු 3)

ii. කෝට්ටේ රාජධානි සමයේ පැවති සාම්ප්‍රදායික පරිපාලන සැලැස්ම හා නිලධාරීන් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පරිපාලන ආයතනය | ප්‍රධාන පරිපාලන නිලධාරියා |
|---|---|
| දිසාවනිය | A................................ |
| කෝරලය | B................................ |
| C.............................. | අතුකෝරාල |
| ගම | D................................ |


(ලකුණු 4)

iii. පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු හතරක් නම් කරන්න. (ලකුණු 4)

07) දී ඇති පින්තූර හා සිතියම උපයෝගී කරගන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1. පින්තූරයේ දැක්වෙන පොකුණ පිහිටි උයන කුමක් ද?
2. එම උයන පිහිටි රාජධානිය කුමක් ද?
3. මෙම උයන ඉදිකර ඇත්තේ කාගේ පරිහරණය සඳහා ද?



4. පින්තූරයේ දැක්වෙන පිළිමගෙය කුමක් ද?



5. එය පිහිටි රාජධානිය කුමක් ද?
6. එම පිළිමගෙය ඉදිකර ඇති සම්ප්‍රදාය කුමක් ද?

මෙම පින්තූරයේ දැක්වෙන්නේ කැලණි විහාරයේ සිතුවමකි.

7. සිතුවමින් දැක්වෙන රජතුමා කවු ද?
8. එම සිතුවමෙන් දැක්වෙන ස්වාමීන් වහන්සේ කවුද?





9. පිළිරුවෙන් දැක්වෙන රජතුමා කවුරුන් ද?
10. ඔහුගේ පාලන මධ්‍යස්ථානය කුමක් ද?
11. එතුමා අයත් රාජ වංශය කුමක් ද?

(ලකුණු 11)